**සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව**

1. පන්තිය - 8 ශ්‍රේණිය විෂයය - සිංහල අදාළ සතිය - ඔක්තෝම්බර් 1 සතිය

2. පාඩම් හෝ ඒකකය - 19 ප්‍රවෘත්ති

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

   I. ගුවන් විදුලි, රූපවාහිනි ප්‍රවෘත්ති විකාශවලට සවන් දෙන්න.
   II. ඒවායෙහි ඔබ දකින විශේෂතා ලියන්න.
   III. නියමිත පාඩම කියවා ප්‍රවෘත්ති ප්‍රකාශනයක විශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
   IV. ප්‍රවෘත්ති වල විවිධ ප්‍රභේද පවතින බව හඳුනා ගන්න.
   V. ඒ පිළිබඳ වැඩිහිටියන් සමග සාකච්ඡා කරන්න.
   VI. විරාම ලකුණු පිළිබඳව පාඩම කියවා හඳුනා ගැනීමට උනන්දු වන්න.
   VII. e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදි ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙනගන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   I. e නැණපියස -
      - [8 සිංහල: ප්‍රවෘත්ති - සහක්‍රියාකාරි (Interactive) පාඩම (enenapiyasa.lk)]

   II. වෙනත් - යූ ටියුබ්

      a. [ඉගෙනුම් උපකාරකය.pdf - Google Drive]
      b. [ඇගයීම හා පිළිතුරු.pdf - Google Drive]

   III. අතිරේක පොත් / සඟරා -
      - සන්නිවේදන මාධ්‍යය අධ්‍යයනය - සිඩ්නි ඩයස්

5. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල
   I. ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශනයක ලක්ෂණ ඉදිරිපත් කරයි.
   II. ගුවන් විදුලි ප්‍රවෘත්ති වලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
   III. නිවැරදි විරාම ලකුණු භාවිත කරමින් ලියයි.
   IV. ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ කුසලතාව ඇති කර ගැනීමට කටයුතු කරයි.
   V. රට හා ලෝකය පිළිබඳ දැනුවත් වීමට ප්‍රවෘත්ති වල අගය අන් අය සමග සාකච්ඡා කරයි.

6. ඇගයීම හා තක්සේරුව
   I. ඔබ තෝරාගත් ගුවන් විදුලි ප්‍රවෘත්තියක වැදගත් යැයි හැඟෙන ප්‍රධාන කරුණු ලේඛනගත කරන්න.
   II. පාඩමේ ඇතුළත් අවබෝධය අභ්‍යාසවලට පිළිතුරු ලියන්න.
   III. පාඩමෙහි එන විරාම ලක්ෂණ වලට අදාළ ලිඛිත අභ්‍යාසයට පිළිතුරු සපයන්න.
   IV. එහි ප්‍රායෝගික අභ්‍යාසය ද කිරීමට උත්සහ කරන්න.
   V. පහත සිද්ධි වලට අදාළ ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශ නිර්මාණය කරන්න.

      - මිනිසා ප්‍රථමවරට සඳ මතට පා තැබූ දින විකාශය වූ ප්‍රවෘත්තිය
      - මේ දිනවල ශ්‍රී ලංකාව මුහුණ පා ඇති කොවිඩ් 19 ආපදාව පිළිබඳ ප්‍රවෘත්තිය
      - ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ඉන්දියානුවන් පැරදවීමේ ප්‍රවෘත්තිය